ආසියානු වැඩමුළුව

## IYAFA 2022- තිරසර හා සමානාත්මතාවයෙන් යුතු සුළුපරිමාණ ධීවර කර්මාන්තය සමරමු

පලමු සැසිවාරයඃ සුළුපන්න ධීවර ප්‍රජාවට සම්පත් සදහා ප්‍රවේශය

ධීවර සංදර්භය තුල ප්‍රවේශය යන වචනය සැලකිය හැක්කේ අයිතියක් හෝ ප්‍රතිලාභ ලැබීමට අවස්ථාවක් හෝ සජීවී සම්පතක් භාවිතය හෝ ඒවායින් ප්‍රතිලාභ ලැබීම හෝ යම් භූමියක් ආශ්‍රිතව ඇති ජීවින් සහ ජීවන මාර්ග ධීවර ප්‍රජාව විසින් භාවිතයට ගැනීමකි.

එය කිසියම් නීතිමය රාමුවක් හෝ කිසියම් ආයතනික රාමුවකින් තොරව කරදිය හෝ මිරිදිය ධීවර සම්පත් සදහා අවකාශ ඇත්නම් එය විවෘත ප්‍රවේශයයි. එය සාම්ප්‍රදායික හෝ පාරම්පරික ආයතනයක නියෝගයක් මගින් හෝ ආවරණය කර නැත.

වෙනත් ආකාරයකින් ප්‍රවේශය සැලකිල්ලට ගතහොත් එය ආයතනික රාමුවක් මත පදනම් වන්නේ නම්(පාරම්පරික, සාම්ප්‍රදායික හෝ විධිමත් නීතිය තුල) බුක්තියේ අයිතිය බවටද පත්විය හැකිය. මෙමගින් බොහෝ විට පුද්ගලික මට්ටමින් හෝ සාමූහිකව ඉඩම් හෝ ධීවර සම්පත් නීතිමයවම භාවිතයේ අයිතිය පිලිගැනීමටත් එකී අයිතීන් ආරක්ෂා කිරීමටත් යොමුකෙරේ.

ආහාර සුරක්ෂිතතාවයේ සංදර්භය තුල වගකීමක් සහිතව ඉඩම්,ධීවර සම්පත් සහ වනාන්තර වල භුක්තියේ අයිතිය පිලිබද ස්වේච්ඡා මගපෙන්වීම් මාලාවට අනුකූලව බුක්තියේ ක්‍රියාවලීන් යනු බුක්තියේ අයිතිය නිර්ණය කරන සහ බුක්තියේ අයිතිය නියාමනය කිරීමකි. විශේෂයෙන්ම ධීවර පුරුෂයින් හා ස්ත්‍රීන් ටද, මත්ස්‍ය අගය දාමයේ ධීවර කම්කරුවන් හටද ඉඩම්, ජලය හෝ සජීවී ජලජ සම්පත් අයිතිය ලබාගන්නේ කෙසේද යන්නත් සහ මෙම සම්පත් භාවිතා කලහැක්කේ කාටද, කොපමන කාලසීමාවකට, කුමන තත්වයක් යටතේ මෙම අයිතිය ලබාගන්නේද යන්නත් සදහන් ය. ඉඩම් බුක්තිය පිලිබද මගපෙන්වීම් මාලාවට අදාලව අයිතීන් සහ වගකීම් යටතේ වගකීමක් සහිත බුක්තියේ පාලනය සහතික කෙරේ. මෙයට හේතුව වන්නේ ඉඩම් හා වනාන්තරද සමග ධීවර සම්පත් යනු මානව හිමිකම් සාක්ෂාත් කරගැනීම සදහාත්, ආහාර සුරක්ෂිතතාවය සදහාත්, දිළිඳු කම පිටුදැකීම සදහාත, තිරසර ජීවන මාර්ග සදහාත්, නිවාස සදහා සුරක්ෂිතතාවය සදහා සහ ග්‍රාමීය සංවර්ධනය සදහා කේන්ද්‍රීය කාර්යය භාරයක් ඉටුකරන බැවිනි. (4.1 පරිච්ඡේදය)

මසුන් නෙලීමේ සංදර්භය තුල බුක්තියේ අයිතිය පිලිබද අන්තර්ගතයේ ඇතුලත් වන කරුණු; පුද්ගලයෙකුට හෝ ප්‍රජාවකට භාවිතයට අවසර දී ඇති යාත්‍රාව (යාන්ත්‍රික හෝ යාන්ත්‍රික නොවන) සහ ආම්පන්න (ලියකියවිලි, වටකරන, ඇදගෙන යන හෝ එසේ නොවන), යම් නිශ්චය කරන ලද ජල තීරයක හෝ ප්‍රදේශයක දී නිශ්චිත ඉලක්ක ගත සම්පතක් යම් කාල රාමුවකදී නෙලා ගැනීමට අවසර ලැබීමයි. මෙය අලිඛිත පාරම්පරික ක්‍රම හෝ ප්‍රදේශයේ ජීවත්වන ප්‍රජාව ගේ ආචාර ධර්ම, සමූපකාර හෝ සංගම් වල නීතී රීතීන් හෝ රාජ්‍යය පනවා ඇති නීතීන් හෝ බලපත්‍ර හා ලයිසන් ලබාදීම වැනි ක්‍රම විය හැකිය. බුක්තියේ අයිතීන් පිලිබදව ඇති සමහර කරුණු සමහර භූගෝලීය ප්‍රදේශ ආශ්‍රිතව ඉතා හොදින් ගොඩ නැගී ඇති අතර, අනෙකුත් ප්‍රදේශවලදී එය දූර්වලය. එබැවින් ඒවා සමස්ථය සමග එකට

මෙම සංදර්භය තුල මෙහි තිරසර සංවර්ධන ඉලක්ක (SDG ) 14B “සුළු පන්න පාරම්පරික ධීවරයාට කරදිය සම්පත් සහ වෙළදපොල සදහා ප්‍රවේශය සැපයීම” යන්න කරදිය සංදර්භය තුල බුක්තියේ අයිතිය පිලිබදව ඇති වැදගත්කම පිලිබදව ආංශිකව අනුනාද කරයි.

ඉඩම් බුක්තිය පිලිබද අයිතිය තුල ධීවර කටයුතු දියත් කිරීම සදහාත්, මත්ස්‍ය සැකසුම් සහ අලෙවිය සහ ධීවර ප්‍රජාවගේ සුබසාධනය සදහා අවශ්‍ය වන පරිදි තාවකාලිකව හෝ ස්ථිරව ඉඩම් පිලිබද අයිතිය, අවම වශයෙන් නිවාස සහ අනෙකුත් පහසුකම් අන්තර්ගත විය හැකිය.

ආහාර සුරක්ෂිතතාවයේ හා දිළිඳුකම පිටුදැකීමේ සංදර්භය තුල සුළු පරිමාණ ධීවර කර්මාන්තය සුරක්ෂිත කිරීම සදහා වන ස්වේච්ඡා මග පෙන්වීම් මාලාව (සුළු පරිමාණ ධීවර මගපෙන්වීම්) අනුගමනය කිරීමෙන්, රාජ්‍යය මගින් සුළුපන්න ධීවරයින්ට තම රාජ්‍යයේ නීතිමය සීමාව තුල මත්ස්‍ය අස්වනු නෙලීමට සුවිශේෂී බුක්තියේ අයිතියක් ලබාදිය හැකිය. මෙම කරුණ සාක්ෂාත් කරගැනීම සදහා

සුළුපන්න ධීවරයින්ට, විශේෂයෙන්ම ආපදා පාත්‍ර පිරිස්වලට අවශ්‍ය පරිදි අනන්‍ය සුවිශේෂී කලාප වෙන්කර දී බලාත්මක කිරීම මගින් ප්‍රතිලාභ සැලසිය හැකිය.

ඉඩම් සඳහාත්, අනුබද්ධ ජල තීරයන්හිත් බුක්තියේ අයිතිය, වෙරළාශ්‍රිත ජනයාටත් , ගං ඉවුරු ආශ්‍රිත ජනයාටත් ඔවුන්ගේ පවුල්වලටත් අතිශයින්ම වැදගත් වුවත් , කරදියේ හා අභ්‍යන්තර ජලාශ ආශ්‍රිත ව ඇති හා වෙරළාසන්න හා ගං ඉවුරුවල ඉඩම් හිමියන් සඳහාත් ඇති වත්මන් බුක්තියේ සැකසීම් මෙම ජනයාට බාහිරයෙන් පැමිනෙන තර්ජණ වලට මුහුණ දීම සඳහා ප්‍රමාණවත් නොවන බැවින් ඒවා සුළු පරිමාණ පාරම්පරික ධීවරයින්ගේ බුක්තියේ අයිතීන් රැකගෙන ආරක්ෂා කර ගැනීම සඳහා යෝග්‍ය පරිදි තව දුරටත් මුළුමනින්ම හා ක්‍රමවත්ව ක්‍රියාත්මක කිරීම සඳහා පූර්ණව වර්ධනය කල යුතුය. මෙය අද අප ඉදිරියේ ඇති විසඳාගත යුතු අභියෝගයකි.

කණ්ඩායම් සාකච්ඡා සඳහා ප්‍රශ්ණාවලිය

1. ධීවර අගය දාමයේ නිවාස සඳහා සහ වෙනත් ක්‍රියාකාරිත්වයන් සඳහා අවශ්‍ය ඉඩම් සම්පත ඔබ පුද්ගලයෙක් ලෙස හෝ සාමුහිකව බුක්ති විඳින්නේද? මෙම අයිතීන් කාන්තාවන්ට හා පිරිමින්ට වඩාත් සමානාත්මතාවයෙන් හා ආරක්ෂිතව ලබාගැනීම සහතික කරන්නේ කෙසේද?

2. ඔබ හා ඔබ ප්‍රදේශයේ කාන්තාවන්, පිරිමින් සහ මත්ස්‍ය නිෂ්පාදන සැකසුම් කරුවන් වෙරළේ සහ ගං ඉවුරු ආශ්‍රිත ධීවර සම්පත් සඳහා වන බුක්තියේ අයිතිය බුක්ති විඳින්නේද? ඒවා විධිමත් අයිතීන්ද නැතහොත් පාරම්පරික / ස්වදේශීය ජනයාගේ අයිතීන්/පාරම්පරික අයිතීන්ද? උදාහරණ ලෙස බුක්තියේ අයිතීන් මගින් සුළු පරිමාණ ධීවර ප්‍රජාවට තමන්ගේ ප්‍රාදේශීය ජලජ සහ වෙරළාසන්න පරිසර පද්ධතීන් යලි ගොඩ නැංවීමට, සංරක්ෂණය කිරීමට, ආරක්ෂා කර සහ කලමණාකරනය සඳහා දායක වීමට ඇති කාර්භාරය පිලිගනී.

3. ධීවර ප්‍රජාවට තමන්ගේ ඉඩමට හෝ ජල තීරයට ඇති ප්‍රවේශයේ අයිතිය සඳහා කුමන ආකාරයේ තර්ජණයන්ට මුහුණ දෙන්නේද? මෙම තර්ජණ ජයගැනීම සඳහාත් ඒවාට ඔරොත්තු දීම සඳහාත් බුක්තියේ අයිතීන් හි ඇති හැකියාව කුමක්ද?

4. සුළුපන්න ධීවර ප්‍රජාවගේ ඉඩම් සඳහා සහ ජල තීරය සඳහා ඇති බුක්තියේ අයිතියෙන් නීති විරෝධීව හෝ අත්තනෝමතිකව ඉවත් කිරීම හෝ අයිතිය හමාර කිරීම සිදුකර තිබේද?

5. ගැටුම්කාරී තත්වයන් නිසා හෝ ස්වාභාවික ආපදාවන් නිසා අහිමිව අවතැන්වූ පාරම්පරික ධීවර බිම් සහ වෙරළාසන්න ජනයාගේ වෙරළාසන්න ඉඩම් සඳහා ප්‍රවේශය යලි ලබාදීම සඳහා කිසියම් ක්‍රියාවලියක් ආරම්භකර තිබේද?

6. මහා පරිමාණ සංවර්ධන ව්‍යාපෘතීන් දියත් කිරීමට පෙර ඵලදායක උපදේශණ ක්‍රියාකාරිත්වයක් සුළු පරිමාණ ධීවර ප්‍රජාව සමග දියත් කර තිබේද? මෙම උපදේශණ ක්‍රියාවලීන් හි ප්‍රතිපලයක් ලෙස සමාජ, ආර්ථික සහ පාරිසරික බලපෑම් අධ්‍යයනයන් දියත් කර වාර්තා කර තිබේද?

7. බුක්තියේ අයිතිය ආශ්‍රිත පැන නගින අර්බුධ කාරී තත්වයන් විසඳා ගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් පවතීද? එනම් හිමිකරුට ආපසු හිමිකම ලබාදීම, අලාභ හානියට වන්දි ගෙවීම, සාධාරණ වන්දි ලබාදීම සහ හානි පූරණය කිරීම ආදී පියවර ගැනීම සිදුවේද?